# සිංහල

# විෂය මාලාව

# 2007

10 ශ්‍රේණි දෙවන බස සිංහල විෂය නිර්දේශ අන්තර්ගතයි.

සිංහල දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

නිපුණතා පාදක ව සකස් කර ඇති මෙම විෂයමාලාව, භාෂා
ශක්‍යතාව සංවර්ධනය මෙන් ම සන්නිවේදන ශක්‍යතාව
සංවර්ධනය ද ප්‍රමුඛ කර ගන්නකි.
පාසලේ දී පමණක් නොව මුළු ජීවිත කාලයේදී ම
ප්‍රායෝගික භාෂා කාර්යයන්හි දී
විපුල ඵල නෙලා ගත හැකි වන පරිදි
නිපුණතා රැසක් ප්‍රගුණ කර ගැනීම අවධාරණය කර ඇත.

# දෙවන බස සිංහල

## විෂය නිර්දේශය

(2007 වර්ෂයේ සිට ක්‍රියාත්මකයි.)

## 10 වන ශ්‍රේණිය

ජාතික අධ්‍යාපන ආයතනය

■ සවන්දීම

1.0 නිපුණතාව

එදිනෙදා ජීවිතයේ විවිධ අවස්ථා හා සිද්ධි ඇසුරෙන් කෙරෙන කතාබහට අවධානයෙන් හා අවබෝධයෙන් සවන් දී නිසි ප්‍රතිචාර දක්වයි.

1.1 යම්කිසි සිද්ධියක් පදනම් කරගෙන ඇතිවන කතා බහට අවධානයෙන් සවන් දී ප්‍රතිචාර දක්වයි.

- මිතුරන් සමග විනෝදවන අවස්ථාවක දී ඇතිවන කතා බහට සවන් දී අනුකරණාත්මක ව භාවිත කිරීම.
  - මුහුදේ නෑම වැනි අවස්ථාවක්

2.0 නිපුණතාව

නිවේදන, විධාන, නියෝග, පණිවිඩ, අවවාද, උපදෙස්වලට අවධානයෙන් යුතු ව සවන් දී අවස්ථාවෝචිත ව ප්‍රතිචාර දක්වයි.

2.1 විවිධ පරිසරවලදී අසන්නට ලැබෙන පණිවිඩවලට සහ නිවේදනවලට අවධානයෙන් සහ අවබෝධයෙන් යුතු ව සවන්දී උචිත පරිදි ක්‍රියා කරයි.

- නිවැසියන් හා අසල්වැසියන් අතර සිදුවන පණිවිඩවලට සවන්දීම; ස්මරණයෙන් යුතු ව යමක් ප්‍රකාශ කිරීම.

3.0 නිපුණතාව

දෙබස්, සංවාද හා සාකච්ඡා ආදියට සවන් දී අනුකරණාත්මක ව නිසි අවස්ථාවල දී භාවිත කරයි.

3.1 දෙදෙනෙකු අතර ඇතිවන කතා බහට සවන් දී අවස්ථාවෝචිත ව අනුකරණය කරයි.

- වෙළෙඳපළ වැනි ජනාකීර්ණ ස්ථානයක දෙබස්වලට සවන්දීම; ප්‍රතිචාර වශයෙන් අදහස් දැක්වීම.

3.2 සංවාද සාකච්ඡාවලට ඇහුම්කන්දෙමින් හා ඒවාට සහභාගිවෙමින් අදහස් දක්වයි.

- පාසලේ ත්‍යාග ප්‍රදානෝත්සවයක් සංවිධානයේ දී ඇතිවන සංවාදයකට සවන්දීම; ප්‍රශ්න නගමින් සුදුසු ප්‍රතිචාර දැක්වීම.

4.0 නිපුණතාව

කවි හා ගීතවලට සවන් දී ගායනා කරයි.

4.1 කවි හා ගීතවලට සවන් දී ගායනා කරමින් රස විඳියි.

- ගීත හෝ කවි අදාළ තාලය අනුව ඒකල වශයෙන් ගායනා කිරීම.

- සමූහ වශයෙන් ගායනා කිරීම.

5.0 නිපුණතාව

කතන්දරයකට සවන් දී මතකයෙන් කියයි.

5.1 කතන්දරයකට සවන් දී එය කෙටියෙන් කියයි.

- කතන්දරයකට සවන්දීම;
  සිද්ධි අනුපිළිවෙලින් පැවසීම හා කතාව කෙටියෙන් කීම

6.0 නිපුණතාව

විවිධ ප්‍රවෘත්ති හා කතාවලට සවන් දී වැදගත් කරුණු ප්‍රකාශ කරයි.

6.1 ගුවන්විදුලි හා රූපවාහිනී ප්‍රවෘත්තිවලට අවධානයෙන් සවන් දී සිත් ගත් යමක් අන්‍යයන්ට කියයි.

- ගුවන්විදුලි හා රූපවාහිනි වැඩසටහන්
  විවිධ ප්‍රවෘත්ති
  කාලගුණ වාර්තා
  ක්‍රීඩා තොරතුරු
  සාකච්ඡා

■ කථනය

7.0 නිපුණතාව

අචාරශීලී ව සංයමයෙන් යුතු ව කතා බහේ යෙදෙයි.

7.1 සංයමයෙන් යුතු ව ප්‍රිය වචන භාවිත කරමින් කතා කරයි.

- සංවාදවල දී කරන කතා
  සාකච්ඡාවල දී කරන කතා බහ

8.0 නිපුණතාව

වචන සකසුරුවම් ලෙස භාවිත කරමින් අත්දැකීම් හෝ සිද්ධියක් සිත් ගන්නා පරිදි විස්තර කරයි.

8.1 අත්දැකීම් හෝ සිද්ධියක් කෙටියෙන් කියයි.

- තම අත්දැකීමක්
  ශ්‍රමදානයකට සහභාගි වීම
  සත්තුවත්තේ දී මුහුණදුන් අත්දැකීමක්
- පාසලේදී අත්විදි සිද්ධියක්

9.0 නිපුණතාව

විවිධ මාතෘකා යටතේ කතා කරයි.

9.1 වචන වාක්‍යාංශ හා වාක්‍ය නිවැරදි ව භාවිත කරමින් මාතෘකාවකට අදාළ ව කතා කරයි.

- නම් කරන ලද අවස්ථාවක් ගැන අදහස් දැක්වීම.
- දෙන ලද මාතෘකාවක් යටතේ කතා කිරීම.

10.0 නිපුණතාව

එදිනෙදා කටයුතු හා බැඳුණු කතා බහේ යෙදෙයි.

10.1 සමිති සමාගම් හා උත්සවවලට සහභාගිවෙමින් අදහස් ඉදිරිපත් කරයි.

- නිර්මාණාත්මක අත්දැකීම් ප්‍රකාශ කිරීම
- අවස්ථානුකූල කතා
  මඟුල් ගෙදර
  අවමංගල උත්සව
  සාහිත්‍ය සමිති
  ආගමික සමිති

■ කියවීම

11.0 නිපුණතාව

අදහස් ග්‍රහණය කරගැනීම සඳහා විවිධ ලේඛන කියවයි.

11.1 මූලික තොරතුරු හා අදහස් ලබාගැනීම සඳහා අවබෝධයෙන් යුතුව විවිධ ලේඛන කියවයි. (ශිල්පීය ක්‍රමවලට අනුගතව.)

- විෂයානුබද්ධ අවබෝධය සඳහා කියවීම
  - විද්‍යා ප්‍රබන්ධ
  - ඓතිහාසික තොරතුරු ඇතුළත් නිර්මාණාත්මක ලිපි
    සීගිරිය, ටජ්මහල්, චරිත කතා

11.2 ප්‍රධාන කරුණු අවබෝධකර ගැනීම සඳහා ප්‍රායෝගික ලේඛන කියවයි.

පුවත්පත් කතු වැකි

තීරු ලිපි

සමිති වාර්තා

12.0 නිපුණතාව

කවි, ගීත, කතන්දර ආදී සාහිත්‍යාංග කියවා රස විඳියි.

12.1 සරල කවි හා ගීත තාලානුකූල ව කියවා රස විඳියි.

නිර්මාණ හඳුනාගෙන අගය වටහාගෙන සංවිධානය කිරීම.

දෙවුරේ දිලෙනා සොඳ මුතුමාල පලඳන්නා
දෙකනේ දිලෙනා රන් මිණි තෝඩු ගවසන්නා
හඳයෝ හැමදා නුඹ පණ සේම රැකගන්නා.
(කරත්ත කරුවා හා ගවයා අතර ආදරණීය බැඳීම.)

12.2 කතන්දර ළමා නාට්‍ය ආදිය කියවා රස විඳියි.

එක් සිදුවීමක් වටා ගෙතුණු කතා
චරිත ලක්ෂණයක් විස්තරවන කතා
රයිගමයයි ගම්පලයයි කතාව වැනි කතා.

13.0 නිපුණතාව

සිංහල සංස්කෘතිය හා ජාතික උරුමය හඳුනාගැනීම සහ අගය කිරීම සඳහා අදාළ ලිපි ලේඛන, කවි හා ගීත කියවයි.

13.1 සහජීවනයට හේතුවන විවිධ උත්සව ආදී සංස්කෘතික සාරධර්ම හා ජීවන රටා පිළිබඳ තොරතුරු ඇතුළත් ලේඛන කියවයි.

- සිංහල සිරිත් විරිත් හා උත්සව
  දරුවන්ට අකුරු කියවීම හා සම්බන්ධ නිර්මාණ
- දේශාභිමානී ගීත හා කවි

13.2 සංස්කෘතික දායාද හා සංස්කෘතික උරුමය හඳුනා ගනිමින් ඒවායේ අගය වටහා ගැනීම සඳහා

අදාළ පොත්පත් හා සඟරා කියවයි.

සීගිරිය ගැන නිර්මාණයක්.
දිය ඇලි
අනුරපුර වැව්
රුවන් වැලි මහා සෑය

■ ලිවීම

14.0 නිපුණතාව
අක්ෂර වින්‍යාසය නිවැරදි ව යොදමින් වචන ගලපා වාක්‍ය ලියයි.

14.1 ළ, ල, ශ, ෂ, අකුරු නිවැරදි ව වචනවල යොදා එම වචන ඇතුළත්කර අර්ථවත් වාක්‍ය ලියයි.

- නාමපදයක ල දෙකක් එක ළඟ යෙදීමේදී මුලින් ඇති ල මූර්ධජ වීම.
  විශේෂ, විශිෂ්ට, ශිෂ්ට, දර්ශනය, ප්‍රදර්ශනය, නිදර්ශනය
- ශන - ෂණ යෙදෙන වචන හා එම වචන වාක්‍යවල යෙදීම.

14.2 මහප්‍රාණ අකුරු නිවැරදිව වචනවල යොදා එම වචන ඇතුළත්කර අර්ථවත් වාක්‍ය ලියයි.
මහප්‍රාණ අකුරු ඇතුළත් වචන උචිත පරිදි අර්ථවත් වචනවල හා වාක්‍යවල යෙදීම.
(ඛ, ඝ, ඡ, ඨ, ඪ, ධ, ඵ,භ)
ඛනිජ, ආඝ්‍රාණ, සාකච්ඡාව, කථාව, වර්ධනය, භාණ්ඩය (සුලබව භාවිත වන වචන)

15.0 නිපුණතාව
සම්මත භාෂා රටාවලට අනුකූල ව අර්ථවත් වගන්ති, වාක්‍ය හා ඡේද ලියයි.

15.1 මාතෘකාවකට අදාළව අදහස් පැහැදිලිව ලියයි.

- කතන්දරයක ආරම්භය ඉදිරිපත් කිරීමෙන් පසු ඉතිරි කොටස
  සම්පූර්ණ කර ලිවීම.

15.2 වාක්‍ය නිර්මාණයේ දී ලියන හා කියන සිංහලයේ වෙනස්කම් වටහාගෙන ලියයි.

- ලියන හා කියන සිංහලයේ වෙනස වටහාගැනීම;
  ඒ අනුව වාක්‍ය නිර්මාණය කිරීම.
  මම දොර අරිනවා - මම දොර අරිමි
  නංගී දොර අරිනවා - නංගී දොර අරින්නීය
  නංගී දොර ඇරියා - නංගී දොර අරින්නීය
  ළමයි දොර අරිනවා - ළමයි දොර අරිති
  අපි මඟුල් ගෙදර යනවා - අපි මඟුල් ගෙදර යමු
  ඔබ යන්නේ කොහෙද ? - ඔබ කොහි යන්නෙහිද?

15.3 වාක්‍යයක උක්තය සහ ආඛ්‍යාතය හඳුනා ගනිමින් උක්තයට අනුව ආඛ්‍යාතය ගලපා
වාක්‍ය නිර්මාණය කරයි.

- උක්ත ආඛ්‍යාත පද නිවැරදිව ගළපමින් වාක්‍ය නිර්මාණය කිරීම.
  දැරිය මල් කැඩුවාය.
  කුරුල්ලෝ කැදලිවලට පියාඹති.

15.4 ඒකවචන බහුවචන නාමපද සුදුසු පරිදි වාක්‍යවල යොදයි.

- ඒකවචන බහුවචන නාම පද සහිත වාක්‍ය නිර්මාණය කිරීම.

15.5 ලියන සිංහලයෙහි යෙදෙන ප්‍රාණවාචී නාමපදවල උක්ත අනුක්ත භේදය වටහාගෙන ලියයි.

- ප්‍රාණවාචී අප්‍රාණවාචී නාමපදවල උක්ත අනුක්ත භේදය වටහාගෙන වාක්‍ය ලිවීම.
  මිනිසෙක් - මිනිසෙකු - මිනිසෙක් පාරේ යයි, මම මිනිසෙකු දකිමි.
  දැරියක් - දැරියක - දැරියක් මල් කඩයි, ගැහැණියක් දැරියක නලවයි.
  බල්ලෙක් - බල්ලෙකු - බල්ලෙක් පාරේ දුවයි, මිනිසා බල්ලෙකු එළවයි.
  දැරියෙක් - දැරියකු - දැරියෝ නිදති.

15.6 නාමපදවල ලිංග භේදය අනුව ක්‍රියාපද නිවැරදි ව වාක්‍යවල යොදයි.

- නාමපදවල ලිංග භේදය අනුව නාමපද හා ක්‍රියාපද නිවැරදි ව වාක්‍යවල යෙදීම.
  තාත්තා පොළට යයි.
  අම්මා පොළට යන්නීය.
  පුතා පොත බැලුවේය.
  නංගී පොත බැලුවාය.

15.7 සර්ව නාම පද නිසි පරිදි යොදමින් වාක්‍ය ලියයි.

- සර්ව නාම පද නිසි පරිදි වාක්‍යවල යෙදීම.
  මම, අපි, තමුන්නාන්සෙ.
  ඔබ, ඔබවහන්සේ, ඔබතුමා
  ඔයා, මෙයා, ඌ
  - මම කඩයට යනවා.
  - ඌ පාරදිගේ යනවා.

15.8 කාලභේදයට අනුව (අතීත, අනතීත) සුදුසු ක්‍රියාපද යොදා වාක්‍ය ගොඩ නගයි.

- කාලභේදය අනුව සුදුසු ක්‍රියාපද යොදා වාක්‍ය නිර්මාණය කිරීම.
  ළමයා පොත කියවයි.
  ළමයි පොත් කියවති.
  ළමයා පොත් කියෙව්වේය.
  ළමයි පොත් කියවූහ / කියෙව්වෝය.
  ළමයි හෙට පොත් කියවති.

15.9 විවිධ ක්‍රියාපද වර්ග වාක්‍යවල නිවැරදිව භාවිත කරයි.

- අසම්භාව්‍ය ක්‍රියාපද වාක්‍යවල යෙදීම.
  මා නාවොත් ඔබ යන්න.

කුකුළන් හඬලද්දි අපි ඒ ගමන පිටත්වීමු.

16.0 නිපුණතාව

විවිධ පද, උපමා රූපක හා භාෂා ව්‍යවහාර භාවිත කරමින් ලියයි.

16.1 සමානාර්ථ පද විරුද්ධාර්ථ පද නිවැරදි ව භාවිත කරයි.

- සුදුසු සමානාර්ථ පද යොදා අර්ථවත් වාක්‍ය ගොඩ නැගීම.
- පාඩමේ ඇති නියමිත පදවලට විරුද්ධාර්ථ පද සොයා අර්ථවත්ව වාක්‍යවල යෙදීම.

16.2 යුගල පද හා සමූහාර්ථවාචී පද සුදුසු පරිදි වාක්‍යවල යොදයි.

- සුදුසු යුගල පද යොදා අර්ථවත් වාක්‍ය ගොඩ නැගීම.
- සමූහාර්ථ පද සුදුසු පරිදි භාවිත කරමින් වාක්‍ය නිර්මාණය කිරීම.

16.3 භාෂා යෙදුම්, උපමා රූපක රූඩි හා ප්‍රස්ථාව පිරුළු භාවිත කරමින් සාරවත් වැකි ලියයි.

- උපමා රූපක
  මල් වැනි ලස්සන ළමයි.
  මී මැස්සන් වගේ කඩිසර ළමයි.

16.4 විශේෂණ පද හා නිපාත පද විවිධ ස්ථානවල හා විවිධ අර්ථවල යොදා ලියයි..

- නිපාත පද විවිධ ස්ථානවල හා විවිධ අර්ථවල යෙදීම.
  එසේය හිමියනි ඔබගේ වදන් පිළිගනිමි.
  අද අපට නිවාඩු ලැබෙනවා ලු.
  මව හා පියා මිස දරුවනට කවුරු සලකත්ද?
  හා ! අපූරු මල් උයනක්
  නිස්කෝ නම් සංවිධානයක් ලංකාවේ ඇත.

17.0 පද බෙදීම හා විරාම ලක්ෂණ පිළිබඳ සැලකිලිමත් වෙමින් රචනා ලියයි.

17.1 විරාම ලකුණු සුදුසු ස්ථානවල යොදයි.

- පද කෙටි කිරීම සඳහා තිත භාවිත කිරීම.
  පුද්ගල නාම, තනතුරු නාම, ස්ථාන නාම, ආයතන නාම ආදිය
- යුගල උඩු කොමා, ප්‍රකෘති භාෂණ හා උද්ධෘත පාඨ දැක්වීම.
  $මම ගෙදර යමි යි` ඔහු කීය.
  $ඔහුගේ නිවාසයේ නම සිරිමැදුර ය.`

17.2 මාතෘකාවකට අදාළව කරුණු සංවිධානය කරමින් රචනා ලියයි.

- මාතෘකා යටතේ රචනා ලිවීම.

18.0 එදිනෙදා අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා ප්‍රායෝගික ලේඛන කටයුතුවල යෙදෙයි.

18.1 සම්මත ආකෘතින්ට අනුව පෞද්ගලික, ව්‍යාපාරික හා රාජකාරි ලිපි ලියයි.

- පාසල් සාහිත්‍ය සමිතියේ ලේකම් විසින් සාහිත්‍ය උත්සවය පැවැත්වීම සඳහා පාසල් රංග ශාලාව වෙන්කර ගැනීමට අවසර පතමින් විදුහල්පති වෙත යවන ලිපියක්.

18.2 විවිධ ආකෘතිපත්‍ර සම්පූර්ණ කරයි.

- ජීව දත්ත ඇතුළත් ඉල්ලුම් පතක් පිළියෙල කිරීම.
- ඉල්ලුම්පත් සම්පූර්ණ කිරීම.

19.0 ලේඛනයක් කියවා අවබෝධකරගෙන අදහස් සාරාංශකර ලියයි.

19.1 ප්‍රධාන කරුණු මතුකරගෙන සටහන් කරයි.

- කතාවක මූලික කරුණු මතුකරගෙන ලිවීම.
- කතන්දරයක අදහස් හකුළුවා ලිවීම.

19.2 ප්‍රධාන කරුණු පෙළගස්වා ලියයි.

- වාර්තාවක, දැන්වීමක, අත්පත්‍රිකාවක අදහස සාරාංශ කර ලිවීම.